අ.දූ.චෝ.වි.කො.ස.චක්‍රලේඛ අංක: **01/ 2025**

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන
කොමිෂන් සභාව,
අංක 36,
මලලසේකර මාවත,
කොළඹ 07.
**2025.03.27**

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 (1) වගන්තිය යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමට අදාළ වන තැනැත්තන් සහ භාරගන්නා ආයතන ප්‍රධානීන් වෙත.**

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත මඟින් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 1 දරන වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ඉවත් කර ඇති අතර, දූෂණ විරෝධී පනතේ 79 වගන්තියේ සිට 92 වගන්තිය දක්වා වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම සම්බන්ධ විධිවිධාන දක්වා ඇත.

2. ඒ අනුව, මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතියක් ස්ථාපිත කර, එමඟින් වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා ගැනීම හා සත්‍යායනය කිරීමේ වගකීම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

3. කොමිෂන් සභාව විසින් දැනටමත් ආරම්භ කර ඇති මෙම මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය ස්ථාපනයට අදාළ මූලික වැඩකටයුතු නිම කර මධ්‍යගත ඉලෙක්ට්‍රොනික ඉදිරිපත් කිරීමේ පද්ධතිය බලාත්මකභාවයට එළඹෙන තෙක්, සංක්‍රාන්ති කාලසීමාව තුළ හෝ තාක්ෂණික දෝෂ හේතුවෙන් ඉලෙක්ට්‍රොනික පද්ධතිය අඩපණ වී ඇති සුවිශේෂී අවස්ථාවක වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය 83(7) වගන්තිය ප්‍රකාරව අතින් ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් අවසරය ලබා දී ඇත.

4. ප්‍රකාශකයා විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති ආකෘතියට අනුව, වත්කම් සහ බැරකම් ප්‍රකාශ අදාළ ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතුය.

5. එම ප්‍රකාශය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ දක්වා ඇති ඩිජිටල් ආකෘතිය පුරවා අත්සන් කරන ලද මුද්‍රිත පිටපත මඟින් ආයතන ප්‍රධානියා වෙත ලබා දීම සිදු කළ යුතුය.

6. එකී ආයතන ප්‍රධානියා විසින් එම සියලු ප්‍රකාශ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස මෙයින් නියම කරනු ලැබේ.

7. එකී පනතේ 80 (1) වගන්තිය යටතේ දක්වා ඇති වත්කම් සහ බැරකම් ප්‍රකාශ සිදු කළ යුතු තැනැත්තන් **ඇමුණුම II** හි **I** තීරයේ ද, අදාළ තැනැත්තන් සිය වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කළයුත්තේ කාහට ද යන වග **ඇමුණුම II** හි **II** තීරයේ ද, ඇතුළත් කර ඇත.

8. එකී පනතේ 82 වගන්තිය අනුව **ඇමුණුම III** හි වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දීමට බැඳී සිටින අවස්ථාවන් දක්වා ඇත.

9. තවදුරටත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ සම්පූර්ණ කිරීමේ **මාර්ගෝපදේශය** අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් ඔබගේ පරිශීලනය සඳහා ලබා ගත හැක.

10. එම ප්‍රකාශ මධ්‍යම අධිකාරිය වෙත ලබා දීමේදී, ඔබ විසින් අවධානය යොමු කළ යුතු සහ ක්‍රියා කළ යුතු ආකාරය මෙම චක්‍රලේඛයට අමුණා ඇති උපදෙස් පත්‍රිකාවේ **(ඇමුණුම X)** දක්වා ඇත.

11. එහි දක්වා ඇති ආකෘතීන් වලට අදාළ තොරතුරු සම්පූර්ණ කර මෘදු පිටපත් **assets@ciaboc.gov.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර, දෘඪ පිටපත් වත්කම් සහ බැරකම් ප්‍රකාශ කොමිෂන් සභාව වෙත යොමු කිරීමේදී ඒ සමඟ එවීමට කටයුතු කළ යුතුය.

**කොමිෂන් සභාවේ අණ පරිදි,**



**අධ්‍යක්ෂ ජනරාල්**
**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**